**ගෝලීය ශ්‍රී ලාංකික සංසදය,**

**ශ්‍රී ලංකාවේ නේවාසික නියෝජිත කාර්යාලය,**

**කොළඹ.**

**ගරු ගැන ජනාධිපතිතුමා,**

**ජනාධිපති ලේකම් කාර්යාලය,**

**කොළඹ.**

**ශ්‍රී ලංකාව ශ්‍රී ලංකාව පිළිබඳ මානව අයිතිවාසිකම් මහ කොමසාරිස් කාර්යාලය මගින් කරන ලද විමර්ශන වාර්තාවේ "යුද අපරාධ" යන්න සඳහන් කර ඇති බව තහවුරු කිරීම**

**උක්ත කරුණ පිළිබඳව ඔබතුමා මුණගැසී සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා ගැනීමට නොහැකිවීම පිළිබඳ ගෝලීය ශ්‍රී ලාංකික සංසදය ලෙස ඔබ තුමාට අපගේ කණගාටුව ප්‍රකාශ කරමු. ගෝලීය ශ්‍රී ලාංකික සංසදය අප මව්බිමේ ඒකීය භාවය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා වනු දැක්ම අපේක්ෂා කරන විදේශයන්හි සේවය කරනු ලබන ශ්‍රී ලාංකිකයින් ගෙන් සැදුම්ලත් නිර්පාක්ෂික සංවිධානයකි. මෙම ලිපිය ඔබතුමා වෙත යොමු කිරීමට හේතු වන්නේ මීට පෙර අප ඔබතුමා මුණ මුණගැසුණු අවස්ථාවකදී මතුවූ විවාදාත්මක කරුණකි. එනම් OISL වාර්තාවේ යුද අපරාධ යන වචනය සඳහන් නොවන බව ඔබතුමා විසින් ඉදිරිපත් කළ මතය යි.**

**එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මානව හිමිකම් කොමසාරිස් සෙයිඩ් අල් හුසේන් 2016 පෙබරවාරි මස 09වන දින ශ්‍රී ලංකාවේ දී පැවසුවේ ජාත්‍යන්තර ප්‍රජාවට අවශ්‍ය වී ඇත්තේ ශ්‍රී ලංකාව නැවතත් ජාත්‍යන්තර තලයේ කටයුතු වල කිසිම බාධාවකින් තොරව කටයුතු කරන බව දැකීමත්, ශ්‍රී ලංකාව ආර්ථික වශයෙන් ප්‍රබලයකු වන බව දැකීමත්, ශ්‍රී ලාංකික හමුදාවේ මුහුණේ ගැවී ඇති කලු පැල්ලම් ඉවත් කිරීමත්, ඒ තුලින් නැවතත් ශ්‍රී ලාංකික හමුදාවට ජාත්‍යන්තරයේ සාම හමුදා ක්‍රියාදාමයන්ට එක් වීමට ලැබීමත් සහ විශාල ප්‍රමාණයක් වූ ශ්‍රී ලාංකික හමුදා සාමාජිකයින් හට නිසි ඇගයීමක් ලබා දීමත් බව ය. ඔහු එහිදී ශ්‍රී ලාංකික හමුදාවේ මුහුණේ ගැවී ඇති කලු පැල්ලම් වශයෙන් සඳහන් කරන ලද්දේ OISL වාර්තාවේ ශ්‍රී ලංකාවේ හමුදාව වෙත එල්ල කර ඇති යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ පිළිබඳ බව වාර්තාව අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ.**

**OISL වාර්තාවේ දෙවන වගන්තියේ මෙසේ සඳහන් කර ඇත. "පුළුල් විමර්ශනයක් සඳහා ඉල්ලීම් සිදු වූයේ 2009 ගැටුමේ අවසාන කාල සීමාවේ දී ශ්‍රී ලංකා ආණ්ඩුව සහ තමිල් ඊළම් විමුක්ති කොටි සංවිධානය යන පාර්ශව දෙක විසින්ම කරන ලදැයි කියන යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ ඇතුළුව විශාල වශයෙන් සිදු වූයේ යැයි කියන කෲරකම් පිළිබඳ වගවීම තීරණය කෙරෙන විශ්වාසය රැඳවිය හැකි ජාතික ක්‍රියාපටිපාටියක් නොමැතිවීම ගැන ජාත්‍යන්තර සහ ජාතික අවධානය වැඩි වශයෙන් යොමු වීමෙන් පසුවය. එසේ වුවත් විමර්ශන සඳහා ලබාදුන් මැන්ඩේට් බලය 2002 පෙබරවාරි සිට 2011 නොවැම්බර් දක්වා කාලය ආවරණය වන නිසා ගැටුමේ අවසාන කාල සීමාවට වඩා පුළුල්ය" යන්න වශයෙන් සඳහන් වේ.**

**ඉහත වගන්තියෙන් OISL වාර්තාවේ අරමුණ පැහැදිලි වන අතර යුද අපරාධ යන්න පැහැදිලි ව සඳහන් වේ.**

**ඉහත වගන්තියෙන් මතුවන තවත් සාවද්‍ය චෝදනාවක් වෙත සැකෙවින් පමණක් ඔබතුමාගේ අවධානය යොමු කරන්නට කැමති අතර ඒ පිළිබඳව වැඩි විස්තරයක් මෙහි සඳහන් නොකරන්නෙමු. එනම් සිදුවූයේ යැයි කියන කෲරකම් පිළිබඳ වගකවීම තීරණය කෙරෙන විශ්වාසය රැඳවිය හැකි ජාතික ක්‍රියා ක්‍රියාපටිපාටියක් නොමැති වීම යන්නෙන් සඳහන් කර ඇති ඡේදයයි. ඔබතුමාද දන්නා පරිදි ඒවන විටත් ඔබ තුමා කැබිනට් අමාත්‍ය ධූරය හොබවන ලද රජයෙන් ''උගත් පාඩම් හා ප්‍රතිසංධානය පිළිබඳ කොමිසම'' (LLRC) වාර්තාව ඉදිරිපත් කර එහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කරමින් තිබුණ අතර (LLRC) වාර්තාවේ නිර්දේශ කර තිබුණ ලෙස ''පරණගම කොමිසම" ක්‍රියාත්මක වෙමින් පැවතුණි. ඒ සඳහා ජාත්‍යන්තර නීති විශාරදයන්ගේ ද සහාය ලබාගෙන ''ක්‍රියාපටිපාටිය'' පවත්වාගෙන යමින් පැවතුන බව සඳහන් කරනු කැමැත්තෙමු. ඒඅනුව OISL වාර්තාව එහි**

ආරම්භයේ දී ම සාවද්‍ය කරුණු මත පදනම් ව ඇති බව පැහැදිලි වේ. මෙම කාරණය අපගේ උත්තමාක්ත මාතෘකාව ට පරිබාහිර බැවින් මේ පිළිබඳව සඳහන් කිරීම මෙපමණකින් අවසන් කරන්නෙමු.

OISL වාර්තාවේ ස්ථාන 37ක යුද අපරාධ යන වචනයෙන් සඳහන්ව ඇත. වගන්ති 1281 කින් සමන්විත වූ OISL වාර්තාවේ වගන්ති 27ක යුද අපරාධ යන වචනය පැහැදිලිව සඳහන් කර ඇති අතර 39ක් වූ නිර්දේශයන්හි නිර්දේශ 3ක යුද අපරාධ යනුවෙන් සඳහන් කර ඇත. ඒවා නම්:

වගන්ති: 2, 6, 70, 90, 190 (foot note 113), 190 (පාද සටහන් 115), 191 (පාද සටහන් 117), 193 (සහ පාද සටහන් 118), 194 (සහ පාද සටහන් 120), 205 (සහ පාද සටහන් 132, two places), 322, 325, 659, 675, 938, 1113, 1116, 1118, 1119, 1130, 1135, 1139, 1141, 1152, 1154 (පාද සටහන් 1209), 1161, 1169, සහ 1243.

නිර්දේශ:18, 20, 36

එයින් 193 සහ 194 යන වගන්තිය "යුද අපරාධ" යන මාත් මාතෘකාව යටතේ 1243 වන වගන්තිය "ශ්‍රී ලංකාවේ යුධ අපරාධ හා මානව වර්ගයාට එරෙහිව අපරාධ වලට එරෙහිව නීතිමය පියවර ගැනීම" යන මාතෘකාවෙ යටතේ ද සඳහන් කර ඇත. ඉහත සඳහන් වගන්ති වලට වල උපුටාගැනීමක් මේ සමග ඔබතුමාගේ දැන්ගැනීම් පිණිස අමුණා ඇත.

මීට අමතරව OISL වාර්තාව පුරාම සඳහන් කර ඇති චෝදනා යුද අපරාධ සහ මානව වර්ගයාට එරෙහි අපරාධ ගණයට වැටෙන අතර ඉන් පැහැදිලි වන්වන්නේ OISL වාර්තාවේ දෙවන වගන්තිය සඳහන් ආකාරයටම ශ්‍රී ලංකාවට OISL වාර්තාවෙන් යුද අපරාධ චෝදනා එල්ල කර ඇති බවයි. එම චෝදනා මොනවාද යන්න සැකෙවින් ඉදිරිපත් කරන්නෙමු.

OISL වාර්තාව මගින් ශ්‍රී ලංකාවට විරුද්ධව ජාත්‍යන්තර නීති දෙකක් යටතේ චෝදනා ගොනු කර තිබිණි එනම් චෝදනා තුනක් ජාත්‍යන්තර මානුෂීය නීතිය international human terin law i h l යටතේ ද චෝදනා හතරක් ජාත්‍යන්තර මානව හිමිකම්කම් නීතිය international human rights law i h r යටතේ ද වේ ඒවා නම්

<u>ජාත්‍යන්තර මානුෂික නීතිය යටතේ චෝදනා:</u>

01.සිවිල් සමාජය සහ සිවිල් ආයතන සහ ඇතිවන යුද්ධයේ බලපෑම. (a) අවිචාරවත් ලෙස බෝම්බ දැමීම (b) රෝහල් මත්ට බෝම්බ දැමීම.

02. යුද්ධය පැවතුන කලාපයේ ජීවත්වන සිවිල් ජනයාට මානුෂීය ආධාර ලබා දීම වැලැක්වීම.

03. නීත්‍යානුකූල නොවන මනුෂ්‍ය ඝාතන.

<u>ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් නීතිය යටතේ චෝදනා:</u>

04. නිදහසේ හිමිකම් උල්ලංඝනය කිරීම (අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම ආදී වශයෙන්)

05. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම
06. වධහිංසා පැමිනණ වීම
07. ලිංගික අපරාධ

යන්න වේ

ඉහත සඳහන් සියලුම චෝදනා අප සංගමය විසින් අනුග්‍රහය දක්වන ලද ''විරුවන්ගේ විත්තිවාචකය" (In defence of the Armed Forces of sri lanka හෙවත් OISL Rebuttal) මගින් නිශේධනය කරන ලද අතර අප විසින් එම වාර්තාව ජිනීවා හි මානව හිමිකම් සමුළුවේ 34 වන සැසිවාරයට ඉදිරිපත් කරන ලදී. මේ සමඟ නැවත මුද්‍රණයේ පිටපතක් ඔබතුමා වෙත ලැබීමට සලස්වන්නෙමු. මෙම වාර්තාව විද්වත් මණ්ඩලයකින් සම්පාදනය කරන ලද අතර

ජාත්‍යන්තරයට ඉදිරිපත් කිරීම සඳහා ඉංග්‍රීසියෙන් සැකසුනි. එබැවින් මෙහි සිංහල පරිවර්තනයක්යක් සඳහා ලබාදීම ගැනීම් සඳහා ඔබතුමාගේ කාරුණිකව අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමු.

සමස්ත OISL වාර්තාව සඳහා පාදකව ඇත්තේ කුප්‍රකට දරුස්මාන් වාර්තාව පසුගිය ඔක්තෝබර් මස බ්‍රිතාන්‍යයේ නේස්බි සාමිවරයා විසින් බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ දී දරුස්මාන් වාර්තාව අසත්‍ය බවත්, ශ්‍රී ලංකාවට එරෙහි ඇති සියලු යුද අපරාධ චෝදනා ඉල්ලා අස්කර ගත යුතු බවත් සඳහන් කරන්නට යෙදුනි. ඔබතුමාද ස්වාමිවරයාව අගයන අතර ගෝලීය ශ්‍රී ලාංකික සංසදය විසින් එල්.ටී.ටී.ඊ නිල වෙබ් අඩවිය සඳහන් වාර්තා පාදක කරගෙන අදාළ කාලය තුළ දී සිදු වී ඇති මරණ සංඛ්‍යාව **8186**ක් බව ද ඉන් **5000** එල්.ටී.ටී.ඊ සාමාජිකයන් බවද ඒ අනුව මැරුණ සාමාන්‍ය මිනිසුන් සංඛ්‍යාව 3000 ක ප්‍රමාණයක් බවද සනාථ කරන ලදී. එසේම හිටපු එල්.ටී.ටී.ඊ සටන්කරුවෙකු සාක්ෂි වල දී ප්‍රකාශ කර තිබුණේ එල්.ටී.ටී.ඊය සැබැවින්ම අත්වැරැද්දකින් පුදුමාතලන් රෝහලට ෂෙල් වෙඩි ප්‍රහාරයක් එල්ල කළ බවත්, අනතුරුව ඔවුන් ඒ පිළිබඳව සමාව ඉල්ලා සිටි බවත්ය. තවද හිටපු මන්ත්‍රී සතාසිවම් කනගරත්නම් මහතා පවසා තිබුණේ 600කට වැඩි සාමාන්‍ය දෙමළ ජනතාවක් එල්.ටී.ටී.ඊය විසින් දඩාවතේ යන බල්ලන් ලෙස සලකා මරා දැමූ බවයි. යුද හමුදාව හෝ නායකත්වය කිසිදු යුද අපරාධ ගනයට වැටෙන කිසිදු ක්‍රියාවක් කර හෝ ඒ සඳහා අනුබල දීමක් කර නොමැති බව ද, යුද හමුදාවට යුද්ධයකදී ජාත්‍යන්තර නීතිය යටතේ ලැබෙන මුක්තිය පවා නොගෙන යුද හමුදාව වඩා භයානක අවදානම් ගෙන සාමාන්‍ය ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීමට කැපවී ක්‍රියා කළ බව LLRC වාර්තාව හා පරණගම කොමිසම හමුවේ ඉදිරිපත් වූ සාක්ෂි මත පැහැදිලිව සනාථ විය.

ඉහත සඳහන් කරුණු සලකා බැලීමේදී පෙනී යන්නේ සමස්ත OISL ක්‍රියාවලිය ශ්‍රී ලංකාවට එරෙහිව සිදු වූ දුෂ්ඨතම ක්‍රියාදාමයක් බවත් එබැවින් OISL නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව නැවත සලකා බැලිය යුතු බවත්ය. ඒ සඳහා ''විරුවන්ගේ විත්තිවාචකය'' මගින් ගත යුතු ක්‍රියා මාර්ගයක් ලෙස දක්වා ඇති ජිනීවාහි එක්සත් ජාතීන්ගේ සංවිධානය මානව හිමිකම් කවුන්සලයේ විශේෂ සැසිවාරයක් ඉල්ලන ලෙසත් එහිදී ශ්‍රී ලංකාවට එල්ල කර ඇති චෝදනා නිසි අධ්‍යයනයකින් තොරව එල්ල වී ඇති බවත්, එබැවින් සමස්ත OISL ක්‍රියාවලියම අහෝසි කිරීමට යෝජනා කර සම්මත කරගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමු.

මෙයට විශ්වාසී,

යසස් ධර්මදාස,
සම ලේකම්,
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය.

නුවන් බැල්ලන්තුඩාව,
ශ්‍රී ලංකාවේ නේවාසික නියෝජිත,
ගෝලීය ශ්‍රී ලාංකික සංසදය.

ලිපියෙහි පිටපත්:

ගෝලීය ශ්‍රී ලංකා සංසදයේ සියලුම ශාඛා ගෝලීය ශ්‍රී ලාංංකික සංසදය garu sub උපදේශක අති පූජ්‍ය බෙංගමුවේ නාලක හිමිපාණන් ගෝලීය ශ්‍රී ලංකා සංසදය ගෝලීය තානාපති ගරු ආචාර්ය will විශවිල් විශ්‍රාමික සරත් වීරසේකර මැතිතුමා ගරු අගමැතිතුමා කරු විදේශ ඇමතිතුමා ගරු ආරක්ෂක ලේකම් තුමා ගරු ත්‍රිවිධ හමුදාපතිවරුන් ජනමාධ්‍ය

ඇමුණුම් all වාර්තාවේ යුද අපරාධ ලෙස සඳහන් වන වගන්ති වල සංක්ෂිප්තය විරුවන්ගේ විත්තිවාචකය